# පළාත් පාලන හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

# ව්‍යාපෘති අධීක්ෂණ අංශය හා ව්‍යාපෘති කළමනාකරණ ඒකක සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

**01. ව්‍යාපෘති අධීක්ෂණ අංශය**

පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් ස්ථාපිත කළ ව්‍යාපෘති අධීක්ෂණ අංශය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලද විදේශ ආධාර යටතේ මුළු වටිනාකම රුපියල් මිලියන 208,548 වැඩි අගයෙන් යුත් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ඒකකය විසින් පළාත් / ග්‍රාමීය මාර්ග, මලාපවහන කළමනාකරණය, පානීය ජලය, ගොඩනැගිලි, ග්‍රාමීය පාලම් හා අධ්‍යාපනික හා සෞඛ්‍ය පහසුකම් ආදිය ඇතුළත් ව්‍යාපෘති පළාත් හා පළාත් පාලන මට්ටමින් සාර්ථකව ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ඒකකයෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ඉහළ නිපුණතා සහිත, ස්වයං උද්යෝගී කාර්යශූර හා කාර්ය සාධනය අරමුණු කොටගත් වෘත්තිකයන් කණ්ඩායමක් අවශ්‍යව ඇත.

| අංකය | තනතුර | ඇබෑර්තු ගණන | වැටුප් තලය |
|---|---|---|---|
| 1 | උපදේශක ඉංජිනේරු (ජල සම්පත් සංවර්ධන හා යටිතල පහසුකම්) | 01 | රුපියල් 88,000.00+7,800 |
| 2 | උපදේශක ඉංජිනේරු (මාර්ග හා යටිතල පහසුකම්) | 01 | රුපියල් 88,000.00+7,800 |
| 3 | උපදේශක ඉංජිනේරු (කොන්ත්‍රාත් කළමනාකරණ) | 01 | රුපියල් 88,000.00+7,800 |
| 4 | මූල්‍ය විශ්ලේෂක | 01 | රුපියල් 88,000.00+7,800 |
| 5 | ප්‍රසම්පාදන විශේෂඥ | 01 | රුපියල් 88,000.00+7,800 |

**2. මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන (GCWWIIP) කොටස 3 ඇමරිකන් ඩොලර් මිලියන 112.83 සහ මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWMP) – ඇමරිකන් ඩොලර් මිලියන 116.1 – අරමුදල් සැපයීම – ආසියානු සංවර්ධන බැංකුව.**

මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ වඩාත් හොඳ අපජල කළමනාකරණ සේවාවන් ලබාදීම මගින් මහකොළඹ ප්‍රදේශයේ ජනතාවගේ නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය වැඩි දියුණු කිරීම වේ.

ව්‍යාපෘතියෙහි ප්‍රධාන විධායක නියෝජ්‍යායතනය පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වන අතර, ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතනය කොළඹ මහ නගර සභාව වේ.

ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංකය | තනතුර | තනතුරු ගණන | | මුළු තනතුරු ගණන | වැටුප් තලය |
|---|---|---|---|---|---|
| | | GCWMP | GCWWMIIP | | |
| 1 | නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | – | 01 | PS2 |
| 2 | ඉදිකිරීම් කළමනාකරු | 01 | 01 | 02 | PS3 |
| 3 | ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 03 | 02 | 05 | PS4-A |
| 4 | ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | – | 02 | 02 | PS4-B |
| 5 | ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | – | 01 | 01 | PS4-C |
| 6 | ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | – | 01 | 01 | PS4-D |
| 7 | ව්‍යාපෘති ඉංජිනේරු (යාන්ත්‍රික) | 01 | – | 01 | PS4-A |
| 8 | සහකාර ව්‍යාපෘති ඉංජිනේරු (සිවිල්) | 02 | 05 | 07 | PS 5 |
| 9 | පරිසර නිලධාරී | 01 | – | 01 | PS 5 |

**3. TCAMP - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (PRDP) – අරමුදල් සැපයීම – ලෝක බැංකුව ණය අරමුදල් අංක – P132833 Cr 5788 LK**

ප්‍රවාහන සහ සබඳතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන අතර, **ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 81 සහ ව්‍යාපෘති කාලය 2019 – 2023 අතර වේ.** ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වනුයේ සියලුම පළාත්වල "සී" හා "ඩී" පංතියේ මාර්ග පුනරුත්ථාපනය කිරීම තුළින් පළාත්වල ප්‍රවාහන සහ සබඳතා සංවර්ධනය කිරීම වේ.

ව්‍යාපෘතියෙහි විධායක නියෝජ්‍යායතනය, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වන අතර, ක්‍රියාත්මක කිරීමේ නියෝජ්‍යායතනය වනුයේ එක් එක් පළාත් සභාවන් වේ.

ඒ අනුව ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහන් අයදුම්පත් කැඳවනු ලැබේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා බඳවා ගනු ලබන කාර්ය මණ්ඩලය කොළඹ කාර්යාලයට අනුයුක්ත කරනු ලබන අතර. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIU) හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක ඒකක (PICU) සඳහා බඳවා ගනු ලබන කාර්ය මණ්ඩලය පළාත් නවය සඳහා අනුයුක්ත කෙරේ.

| අංකය | තනතුර | තනතුරු ගණන | සේවා ස්ථානය | වැටුප් තලය |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | 01 | PMU කොළඹ | PS 3 |
| 2 | මූල්‍ය කළමනාකරණ විශේෂඥ | 01 | PMU කොළඹ | PS 4 - (A) |
| 3 | සහකාර නේවාසික ඉංජිනේරු | 20 | බස්නාහිර පළාත හැර පළාත් 8 අතර බෙදීයනු ඇත | PS 4 - (A) |
| 4 | ද්‍රව්‍ය තාක්ෂණ ශිල්පී | 8 | බස්නාහිර පළාත හැර එක් පළාතකට 1 අයෙකු බැගින් | PS 5 |
| 5 | තාක්ෂණ නිලධාරී | 44 | පළාත් 9 | PS 6 - (A) |

**4. පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය (LDSP)**

LDSP ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන්නේ ලෝක බැංකුව (WB) වෙතින් ලබාදුන් ණය මුදලක් මගින් හා යුරෝපා සංගමය හා ශ්‍රී ලංකා රජය මගින් ලබාදුන් ප්‍රදානයක් මගිනි. ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ, **"පහසුවෙන් ප්‍රතිචාර දක්වන හා වගකිව යුතු ආකාරයෙන් ප්‍රජාවන් වෙත සේවා ලබාදීම සඳහා පළාත් පාලන බලධාරීන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ සහභාගිත්ව පළාත්වල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනයට සහාය වීම වේ."** ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය **ඇමරිකන් ඩොලර් මිලයන 100.85 ක් වේ.** ව්‍යාපෘතියෙහි කාලය වසර හතරක් වේ. (2019–2022)

ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් (PCU) පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ පිහිටුවා ඇති අතර, උතුරු නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත්වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIU) හතරක් පිහිටුවා ඇත. ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයෙහි (PCU) පවත්නා පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංක | තනතුර | තනතුරු ගණන | වැටුප් තලය |
|---|---|---|---|
| 1 | ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | PS 1 |
| 2 | ව්‍යාපෘති ඉංජිනේරු | 01 | PS 4 - A |
| 3 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 | PS 4 - A |

**5. නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)**

RIDEP ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන්නේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) විසින් වන අතර, මුළු පිරිවැය 2017 සිට 2023 දක්වා කාලය සඳහා ජපන් යෙන් මිලියන 15,410 කි. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වනුයේ, උතුරු – නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත්වල, ග්‍රාමීය මාර්ග, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ වාරිමාර්ග හා බීමට සුදුසු ජල සම්පාදන පහසුකම් ඇතුළත්ව මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් දේශීය ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම හා ජීවන තත්ත්වයෙන් නගා සිටුවීම වේ.

ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් (PMU) පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ පිහිටුවා ඇති අතර. උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත්වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක (PIU) 4 ක් පිහිටුවා ඇත.

ඒ අනුව ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

| අංක | තනතුර | තනතුරු ගණන | වැටුප් තලය |
|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු/ ප්‍රසම්පාදන විශේෂඥ | 01 | **PS-3**<br>PMU - 01 (කොළඹ) |
| 2 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | 03 | **PS-3**<br>උතුරු – 01 (යාපනය)<br>උතුරු මැද – 01 (අනුරාධපුර)<br>ඌව – 01 (බදුල්ල) |
| 3 | ඉංජිනේරු / අනුමැති නිලධාරී (Compliance Officer) (මාර්ග, වාරිමාර්ග හා බීමට සුදුසු ජලය) | 01 | **PS-4** වර්ගීකරණය "A"<br>උතුරු මැද – 01 (අනුරාධපුර) |

**පොදු කොන්දේසි :**

- ශ්‍රී ලංකා පුරවැසියන් පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබති.
- විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල පළපුරුද්ද සහිත අයහට ප්‍රමුඛතාව හිමිවේ.
- **තෝරා ගැනීමේ ක්‍රමවේදය :** සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.
- **වයස :** අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන විට අවුරුදු 64 කට වඩා අඩුවිය යුතුය.
- **සේවයට බඳවා ගැනීමේ නියමයන් :** සියලුම පත් කිරීම්, මූලිකව එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනමින් වන අතර, සතුටුදායක කාර්ය සාධනය මත ව්‍යාපෘතිය අවසන් වන තෙක් දීර්ඝ කළ හැක.
- සේවක අර්ථ සාධක අරමුදලට, සේවකයා විසින් තම මාසික වැටුපෙන් 8% ක දායකත්වයක් ලබාදිය යුතු අතර, සේවායෝජක විසින් ඒ සඳහා 12% ක් ද, සේවක භාර අරමුදලට අමතර 3% ක දායකත්වයක්ද ලබාදෙනු ලබයි.
- රාජ්‍ය / අර්ධ රාජ්‍ය අංශයේ සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.
- අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත නැවත රැකියාවේ පිහිටුවීම පදනම යටතේ විශ්‍රාමික රජයේ නිලධාරීන්ද සලකා බලනු ලැබේ.
- සියලුම උනන්දුවක් දක්වන අයවලුන් විසින් තම ජීවදත්ත ඇතුළත් අයදුම්පත් අදාළ අධ්‍යාපන හා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපැලෙන් **ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් **2021.07.12 දින පස්වරු 3.00 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය.**
- කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රටෙහි පවත්නා ගමනාගමන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ලංසුකරුවන්හට තම අයදුම්පත් අදාළ අධ්‍යාපනික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග **Word Format (Font - Times New Roman Font Size - 12)** මගින් PDF ආකෘතියෙන් ඊමේල් ලිපිනය වන **Projects.recruitment@pclg.gov.lk** වෙත 2021.07.12 වන දින පස්වරු 3.00 ට පෙර ලැබීමට සැලැස්විය හැකිය.
  - ❖ අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ හෝ ඊමේල් පතෙහි විෂය රේඛාවෙහි (Ex.Senior engineer - PRDP - PS3) තනතුරෙහි නාමය, ව්‍යාපෘතිය හා වර්ගීකරණය සඳහන් කළ යුතුය.
  - ❖ ඔබ, එක් තනතුරකට වඩා ගණනකට අයදුම්කරනුයේ නම්, ඒ සඳහා වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
  - ❖ ඔබ, ඊමේල් මගින් අයදුම් කරනුයේ නම්, තැපැල් මගින් අයදුම්පතක් එවීම අවශ්‍ය නොවේ.
- අසම්පූර්ණ අයදුම්පත් හා අදාළ අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ. යු. තනතුරුවලට අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් පරාසය සහ අවශ්‍ය වැඩිදුර විස්තර සඳහා කරුණාකර අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා අමාත්‍යාංශ වෙබ් අඩවිය වන www.mpclg.gov.lk වෙත යොමුවන්න.

**ලේකම්,**
**පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.**